# ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

## (සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ) - 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4 හෝ 5)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**හෝ**

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**හෝ**

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

05. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

02. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA 2) සේවා ගණයේ II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

| | | |
|---|---|---|
| **වයස් සීමාව** | - | අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |
| **වැටුප් ක්‍රමය** | - | 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය JM 1-1 (2016) - රු. 42,600-10X775-18X1135-70,580 ක් වේ. |
| **බඳවා ගැනීමේ දී වැටුප් තලය** | - | රු.42,600.00 වේ. |
| **වෙනත් දීමනා** | - | රජය මගින් අනුමත දීමනා හිමි වේ. |

## 02. පරිගණක ජාල සහකාර - 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

පරිගණක ජාල කටයුතු සම්බන්ධ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| **වයස් සීමාව** | - | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |
| **වැටුප් ක්‍රමය** | - | 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA 2-1 (2016) - රු.30,310-10X300-7X350-4X495-20 X660 -50,940 ක් වේ. |
| **බඳවා ගැනීමේ දී වැටුප් තලය** | - | රු.30,310.00 වේ. |
| **වෙනත් දීමනා** | - | රජය මගින් අනුමත දීමනා හිමි වේ. |

## 03. පොත් තබන්නා - 01

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

පොත් තැබීම හෝ ගිණුම්කරණය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (V) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| **වයස් සීමාව** | - | අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ. |
| **වැටුප් ක්‍රමය** | - | 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ඔබේ තනතුරට හිමි වැටුප් ප්‍රමාණය MA 2-1 (2016) - රු.30,310-10X300-7X350-4X495-20 X660 -50,940 ක් වේ. |
| **බඳවා ගැනීමේ දී වැටුප් තලය** | - | රු.30,310.00 වේ. |
| **වෙනත් දීමනා** | - | රජය මගින් අනුමත දීමනා හිමි වේ. |

**පොදු කොන්දේසි**

**සෑම ඉල්ලුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
- රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සපුරාලීමට හැකියාව තිබිය යුතුය.
- සිංහල, ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂා තුනෙන් හෝ සිංහල/ද්‍රවිඩ සමග ඉංග්‍රීසි භාෂාවන්ගෙන් වැඩ කිරීමේ හැකියාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම සහිත අයදුම්කරුවන්ට විශේෂ සැලකිල්ල දෙනු ලැබේ.
- සුදුසුකම්වලට අදාළ සියලුම සහතිකපත්වල පිටපත් සාමාදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර අයදුම්පත්‍රය සමග එවිය යුතුය.
- උපරිම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දී සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ඉහත 01 තනතුරට ඉල්ලුම් කරන අයදුම්කරුවන් සඳහා**

- 2020 වර්ෂයේ රජයේ උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවාගත් ඉල්ලුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලබන අතර, පුහුණුව නොලබන බවට දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

මෙම තනතුරු ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුයි. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ලිඛිත තරඟ විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුර සඳහා බඳවාගනු ලැබේ. ඉහත පුරප්පාඩු සම්පූර්ණයෙන් පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

ඔබගේ අයදුම්පත්‍රය **"සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත 2021.03.30 දිනට පෙර ගෙනවිත් බාරදීම කළ යුතුය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුයි. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුයි. වැඩිදුර තොරතුරු **www.ssb.gov.lk** වෙබ් අඩවියෙන් ලබාගත හැක.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳරාගම,**
**සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය,**
**"සමාජ ආරක්ෂණ පියස",**
**අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.**
**2021.03.08**